

Ursula Meissner/ICRC



Didier Bregnard/ICRC

## ජාත්‍යන්තර මානුෂවාදී නීතිය අදාළ වන්නේ කුමන අවස්ථාවලද?

ජාත්‍යන්තර මානුෂවාදී නීතිය අවස්ථාවන් තුනක් සඳහා අදාළ වෙයි.

- අවම වශයෙන් රටවල් දෙකක්වත් සම්බන්ධවී ඇති ජාත්‍යන්තර සන්නද්ධ ගැටුම්
- රටක භූමි ප්‍රදේශය සම්පූර්ණයෙන් හෝ කොටසක් විදේශීය බලයක් මගින් අත්පත් කරගන්නා අවස්ථාවන්
- රටක් තුල සිදුවන සන්නද්ධ ගැටුම් (උදාහරණ ලෙස රජයේ හමුදා සහ එකක් හෝ ඊට වැඩි සංවිධානාත්මක සන්නද්ධ කල්ලි අතර හෝ නොයෙක් සංවිධානාත්මක සන්නද්ධ කල්ලි අතර)

ගැටුම කවුරුන් විසින් ආරම්භ කළත් එයට සම්බන්ධ සෑම පාර්ශවයක් කෙරෙහිම ජාත්‍යන්තර මානුෂවාදී නීතිය බලපායි.

## ජාත්‍යන්තර මානුෂවාදී නීතියෙන් ආරක්ෂා කරන්නේ කවුද?

සටනට සහභාගි නොවන හෝ තවදුරටත් සටන් වැද නොසිටින පුද්ගලයන් ජාත්‍යන්තර මානුෂවාදී නීතිය මගින් ආරක්ෂා කරයිශ්‍රී උදාහරණ ලෙස

- සිවිල් ජනතාව
- වෛද්‍ය සහ ආගමික කාර්යය මණ්ඩල
- තුවාලවූ, නැව් මුහුදුබත් වීමෙන් විපතට පත්වූ සහ රෝගීවූ සටන්කරුවන්
- යුධ සිරකරුවන්.
- සිවිල් රැඳවියන්

විශේෂිතවූ අවශ්‍යතාවන් හඳුනා ගැනීමෙන්, ජාත්‍යන්තර මානුෂ-වාදී නීතිය මගින්  කාන්තාවන්ට සහ ළමුන්ට අතිරේක ආරක්ෂ-ාවක් සලසා ඇත.



රටවල් 60ක පමණ සංඛ්‍යාවක අපගේ කාර්යයාල පිහිටුවා ඇත.

එහි කාර්‍යයාල පද්ධතිය, සන්නද්ධ ගැටුම් සහ වෙනත් ප්‍රචණ්ඩ අවස්ථාවන්වල වර්ධනයත් සමග  නිතිපතා වෙනස් කිරීම් වලට භාජනය වෙයි.

ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ ප්‍රධාන කාර්යයාලය ස්විට්සර්ලන්තයේ, ජිනීවාහි පිහිටා ඇත.

ICRC

International Commitee of the Red Cross
19, avenue de la Paix
1202 Geneva, Switzerland
T +41 22 734 60 01   F +41 22 733 20 57
E-mail: shop@icrc.org   www.icrc.org
© ICRC, July 2013

0850/259 07.2013 1000

Front cover: Tony Nicoletti/REUTERS

# IHL
# ජාත්‍යන්තර මානුෂවාදී නීතියේ මූලික කරුණු

ICRC

IN BRIEF



Thomas Pizer/ICRC



William Smit/ICRC



Boris Heger/ICRC



Thierry Gassmann/ICRC

## ජාත්‍යන්තර මානුෂවාදී නීතිය යනු කුමක්ද?

- ජාත්‍යන්තර මානුෂවාදී නීතිය (IHL) යනු සන්නද්ධ ගැටුමක ප්‍රතිවිපාක සීමා කිරීමේ අරමුණ ඇති නීති සමුදායකි.
- එය සටන්වැදී සිටින පාර්ශව වලට ආයුධ සහ සංග්‍රාමයේ ක්‍රම භාවිතයේදී සීමාවන් පනවයි.
- එය සටනට සහභාගි නොවන හෝ තවදුරටත් සටන් වැද නොසිටින පුද්ගලයන් ආරක්ෂා කරයි.
- එය සංග්‍රාම නීතිය හෝ සන්නද්ධ ගැටුම් පිලිබඳ නීතිය ලෙසද හැඳින්වේ.

## ජාත්‍යන්තර මානුෂවාදී නීතිය වැදගත්වන්නේ ඇයි?

ජාත්‍යන්තර මානුෂවාදී නීතිය යුද සමයේදී ජනතාවගේ ආරක්ෂාව සහ ගරුත්වය සහතික කිරීම සඳහා පාවිච්චියට ගත හැකි ජාත්‍යන්තර ප්‍රජාව සතු ඉතාම බලගතු මෙවලම් වලින් එකකි. යුද්ධයකදී පවා සීමාවන් ඇත යන මග පෙන්වීමේ මූලධර්මය මත රැඳී, එය මනුෂ්‍යත්වය සුරැකීමට තැත්කරයි.

“ජිනීවා සම්මුතීන් ...... එකිනෙකා කෙරෙහි ඇති සැලකිලිමත්භාවය පිලිබඳ අපගේ පොදු වගකීම ගැන ඉතාම ප්‍රබල ලෙස නිරන්තරයෙන් අපහට මතක් කර දෙයි

නෙල්සන් මැන්ඩෙලා

## ජාත්‍යන්තර මානුෂවාදී නීතියෙන් ආරක්ෂා කරන්නේ කෙසේද?

සන්නද්ධ ගැටුමේ පාර්ශවකරුවන් මෙහෙයුම් හැසිරවීම ජාත්‍යන්තර මානුෂවාදී නීතිය මගින් පාලනය කර ඇති අතර සතුරු භාරයේ සිටින පුද්ගලයන් ආරක්ෂාකරයි, එසේම

- සන්නද්ධ ගැටුමේ පාර්ශවකරුවන්, සටන්කරුවන් සහ සිවිල් ජනතාව අතර වෙනස හඳුනා ගැනීම සහ සිවිල් ජනතාවට ප්‍රහාර එල්ල කිරීමෙන් වැලකී සිටීම
- සටන්කරුවන් සහ සිවිල් ජනතාව අතර වෙනසක් නොතකන්නාවූ හෝ ඉතා දරුණු හානි සිදුකරන්නාවූ ආයුධ පාවිච්චිය ජාත්‍යන්තර මානුෂවාදී නීතියෙන් තහනම් කිරීම හෝ සීමා කිරීම කර ඇත
- සන්නද්ධ ගැටුමේ පාර්ශවකරුවන් තුවාලවූවන්ට සහ රෝගීවූවන්ට රැකවරණය සැපයීම සහ වෛද්‍ය කාර්යය මණ්ඩල ආරක්ෂා කිරීම
- සන්නද්ධ ගැටුමේ පාර්ශවකරුවන් ICRC දූතයන්හට යුධ සිරකරුවන් සහ සිවිල් රැඳවියන් බැලීමට යාමට අවසර දීමෙන් ඔවුනගේ ගරුත්වය සහතික කිරීම.

## ICRC හි භූමිකාව කුමක්ද?

ICRC ජාත්‍යන්තර මානුෂවාදී නීතියේ භාරකරු ලෙස පෙනී සිටියි. එහි කාර්යයන් වලට පාදකවී ඇත්තේ 1949 ජිනීවා සම්මුතීන් හතර සහ 1977 අතිරේක සන්ධාන තුනයි. මෙම නීතිමය ලියවිලි විසින් ෂඤසෑක ට තම ක්‍රියාකාරකම් කරගෙන යෑමට හිමිකම් පවරයි.

- තුවාලවූ, රෝගීවූ හෝ නැව් මුහුදුබත්වීමෙන් විපතට පත්වූ හමුදා සමාජිකයන්හට සහනාධාර ගෙනයෑම,
- යුධ සිරකරුවන් බැලීමට යාම,
- ගැටුම නිසා වෙන්වූ පවුල් සාමාජිකයන් අතර සම්බන්ධතාවය නැවත ගොඩනැගීම,
- සිවිල් ජනතාවට උපකාර කිරීම
- මානුෂවාදී නීතියෙන් ආරක්ෂාව සලසන පුද්ගලයන්හට ඒ අනුව සලකන බවට සහතික කිරීම.